අලව්ව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

**01. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 24 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු. 37,280 ක් වටිනා පරිගණක උපාංග ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | පරිගණක උපාංග යටතේ රු. 36,530 ක් වටිනා පරිගණක බැටරි 09 ක් සහ රු. 750 ක් වටිනා ඩෙල් වර්ගයේ යතුරු ලියනය ගිණුම්ගත වී නොමැති බව පිළිගනිමි. |
| (ආ) | උපකරණ තොග ශේෂය රු. 197,674 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍යප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වේ. | තොග පොත්වලින් උපුටා ගැනීමේදී සිදුව ඇති වැරදීම් හේතුවෙන් නිවැරදි නොවන වටිනාකම් ගිණුම් ගත වී ඇත.නිවැරදි වටිනාකම් ලබාදීමට අදාළ විෂයභාර නිලධාරීන්ට උපදෙස් ලබාදෙන බවද කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයෙන් හා ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 230,995 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ආපදාණය සඳහා 2019.12.19 වන දින ගෙවූ රු. 228,660ලේඛනයේ සටහන් කිරීම අතපසුවීම නිසා 2019.12.31 ට අදාළ උපලේඛනයේ එය ඇතුළත් කර නොමැතිඅතර,වෙනස හෙළිදරව් කරගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) | වටිනාකම රු. 7,307,026 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සඳහා ඔප්පු හා අදාළ උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | **ඉඩම්වලට මීට ඉහතදී තාවකාලික තක්සේරුවක් ලබාදී ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර ඇත.** දැනට **අලව්ව ප්‍රාදේශීයලේකම් සමඟ සාකච්ඡා කර පැවරුම් නියෝග ලබාගැනීමට කටයුතු කරමින් පවතී.**2019 වර්ෂයේ සිට පළාත් පාලන විශ්‍රාම වැටුප් ණයහිමි ලේඛනයක් ආරම්භ කර විගණනයට ඉදිරිපත් කරනු ලැබීය. |

## 1.4 අනුකූල නොවීම්

------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **රීති හා ප්‍රඥප්ති විධිවිධාන** | | | |
| 2018 නොවැම්බර් 23 දිනැති අංක 2099 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති අලව්ව බර්ඩ් පාක් හෝටලයෙන් සහ නිපුණ ආපන ශාලාවෙන් සියයට 1 දක්වා ගාස්තු අයකරගෙන නොතිබුණි. | නියමිත ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති අදාළ හෝටලයෙන් 1% ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,520,211 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,309,488 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

--------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| I. | වරිපනම් හා බදු | 4,649 | 4,320 | 4,276 | 410 | 3,502 | 2,894 | 3,447 | 366 |
| II. | බදු කුලී | 10,564 | 9,772 | 9,765 | 90 | 11,530 | 9,899 | 10,003 | 83 |
| III. | බලපත්‍ර ගාස්තු | 842 | 631 | 631 | - | 1,928 | 2,061 | 2,093 | - |
| IV. | වෙනත් ආදායම් | 34,414 | 74,177 | 74,921 | 40,553 | 90,871 | 74,343 | 63,409 | 41,297 |
| එකතුව | | 50,469 | 88,900 | 89,593 | 41,053 | 107,831 | 89,197 | 78,952 | 41.746 |

### 2.2.2 වරිපනම් හා බදු

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති රු. 365,793 ක හිඟ මුදලින් සමාලෝචිත වර්ෂය තුළදී රු. 142,565 ක මුදලක් අයකර තිබූ අතර අයවීමට පැවති රු. 223,228 ක මුදලින් රු. 126,857 ක මුදලක් 2020 මැයි 30 දින වන විට අයවීමට පැවතුණි. | ඉකුත් වර්ෂය වෙනුවෙන් තවදුරටත් අයවීමට ඇති මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වරිපනම් බදු හා අක්කර බදු හිඟයෙන් 2020.05.30 දින වන විට රු.96,370 ක මුදලක් අයකර ඇති අතර ඉතිරි හිඟයන්ද අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නෙමි. |

### 2.2.3 කුලී

-----

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | අලව්ව බස් නැවතුම්පල කඩ කඩ කාමර 7 ක් බදු නොදීම නිසා නිශ්කාර්යව පැවතුණි. | කඩ කාමර බදු දී සභාවට ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | කඩ කාමර 7 ටෙන්ඩර් ලබා දීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | එක් කඩ කාමරයක් බදුකරු විසින් වෙනත් පාර්ශවයකට පවරා තිබුණද, පැවරුම් ගාස්තු අයකර නව ගිවිසුම්ගතවීමක් සිදුකර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස් (වයඹ) ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කෙසේ වුවද දැනටමත් අදාළ පුද්ගලයා කඩකාමරයේ බදුකරු බැවින් ඇය දැනුවත් කර ගෙවා නොමැතිනම් අයකරගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 වෙනත් ආදායම්

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ උප කාර්යාල සීමාවේ ඇති දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සමීක්ෂණය කර අදාළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණයක් කර අදාළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභා බල ප්‍රදේශයේ ඇති දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සියලු ගාස්තු අයකිරීම ප්‍රධාන කාර්යාලය හරහා සිදුවන බවත් ඉදිරියේදී උප කාර්යාලවලද ගාස්තු අයකිරීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ශේෂය පිළිවෙලින් රු. 3,444,625 ක් හා රු. 37,108,059 ක් විය. | තවදුරටත් අයකර ගත යුතු හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ හා මුද්දර ගාස්තුවලින් මේ වන විට රු. 22,433,860 ක් ලැබී ඇති බව දන්වමි. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යය සාධනය**

**පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කසල කළමනාකරණ මධ්‍යස්ථානයට යාබදව පිහිටි වන රක්ෂිතයට මළ අපද්‍රව්‍ය බැහැර කර තිබූ අතර මේ තුළින් පරිසර හානිය මෙන්ම සෞඛ්‍යයට ද විශාල බලපෑමක් එල්ල වී තිබුණි. | පරිසර ගැටළු අවම වන පරිදි කටයුතු කළ යුතු වේ. | බස් නැවතුම්පල පොදු වැසිකිලියේ ගලි බවුසරය මගින් අදින මළ අපද්‍රව්‍ය දැනට ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘති භූමියේම කොටසක තාවකාලික වලක් කපා එයට බැහැර කරනු ලබන අතර, මෙසේ තාවකාලිකව කටයුතු කරනු ලැබුවද ස්ථිර ඉදිකිරීමක් නියමිත ක්‍රමවේදයට ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘති භූමියේම ඉදිකිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලබන බවද දන්වා සිටිමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 45,977,203 ක ශේෂයෙන් රු. 36,176,490 ක මුදලක් 2019 මැයි 30 දින වන විට තවදුරටත් අයකර ගැනීමට පැවතුණි. | තවදුරටත් ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වරිපනම් රු. 313,636ක මුදලක්ද, අක්කර බදු රු. 27,252 ක මුදලක්ද 2020.05.30 වන විට ලැබී ඇති අතර, ලැබිය යුතු උසාවි දඩ රු. 3,161,875 ක මුදලක් සහ ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 6,542,467 ක මුදලක් 2020 මාර්තු 12 දින වන විට ලැබී තිබුණි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට රු. 33,058,007 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂයෙන්රු. 11,042,506 ක් වසරකට වැඩි කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පැවතුණි. | තවදුරටත් නිරවුල් කළ යුතු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | වසරකට වඩා වැඩි කාලයක් නිරවුල් නොකර ඇති ශේෂයෙන් විශ්‍රාම වැටුප් ණයහිමි ශේෂය මාසිකව අදාල මාසයේ බිල්පත් වටිනාකම සමග රු.20,000 බැගින් ගෙවීම් කරමින් ඇත. |
| (ඇ) | රු. 7,272,981 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂවලට අදාළ කාලවිශ්ලේෂණයක් නොතිබුණි. | හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ විධිමත් අනුමැතිය මත පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | රු.7,272,981 ගෙවියයුතුගිණුම්ශේෂයෙන්රු. 6,991,276 ක්විශ්‍රාමවැටුප්ණයහිමියන්වනඅතර මේ සඳහා පැහැදිලි කාල විශ්ලේෂණයක්ලබාදිය නොහැක්කේ මෙම ශේෂයෙන් වැඩි ප්‍රමාණයක් 2011අප්‍රේල්01 දින නව සභාවක් ලෙස ස්ථාපනය වූ දිනටත් පෙර සිට පැවත එන ශේෂයක් වන බැවිනි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

(අ) **සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාථමික අංශයේ තනතුරු 05 කට අදාළව පුරප්පාඩු 11 ක් හා තනතුරු 03 කට අදාළව අතිරික්ත 05 ක් පැවති අතර අනියම් පදනම මත සේවකයන් 12 දෙනෙක් බඳවා ගෙන තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අනියම් පදනම මත බඳවාගත් සේවකයින් 12 දෙනා සේවා අවශ්‍යතාවය මත පළාත් පාලන දෙපාර්තමේන්තුවේඅනුමැතිය ඇතිව බඳවා ගෙන ඇති අතර, බඳවාගැනීම් කටයුතු තාවකාලිකව නවතා ඇති බැවින් නැවත බඳවාගැනීම් ආරම්භ කල පසු අනෙකුත් තනතුරුවලට බඳවා ගැනීමට කටයුතු කරමි. |

(ආ) **සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මියයාම, ස්ථාන මාරුවීම සහ තොරතුරු සොයාගත නොහැකිවීම මත මාසිකව අය නොවන සේවක ණය මුදල රු.63,653 ක් වී තිබුණි. | ලේඛන යාවත්කාලීන කිරීමට හා හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරවුල් කිරීමට කටයුතු කරමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කුලියට ලබා දී තිබූ බෝයවලාන තාවකාලික කඩ කාමර 06 ක ගිවිසුම් කාලය අවසන් වී තිබුණි. | ගිවිසුම්ගත වී කුලී මුදල් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අදාල බදුකරුවන් දැනුවත් කර නව බදු ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | බෝයවලාන පොදු වෙළෙඳපොලේ කඩ කාමර 02 ක් අතුරු බදු දී තිබූ අතර, එක් කඩ කාමරයක බදුකරු, අතුරු බදුකරු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. | කඩ කාමර බදුදීම් සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ගිවිසුම කඩ කළ කඩ කාමර ඇත්නම් ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව භුක්ති විඳින වත්කම්13 ක් සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | සභාව විසින් භුක්ති විඳින වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඔප්පු නොමැති බැවින් අලව්ව ප්‍රාදේශීය ලේකම්තුමා සමග සාකච්ඡා කර පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. |

### 3.5.2 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකමරු.217,178 ක් වූ අත් ට්‍රැක්ටර් 2 ක් සහ රු.72,000 ක් වටිනා ට්‍රේලර් 2 ක් නිශ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි. | ප්‍රයෝජනයටගත නොහැකි නිශ්ක්‍රීය වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම් අපහරණය කිරීම මෙම වසර තුළ ඉටු කිරීමට කටයුතු කරමි. |